**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 05/93**

මගේ අංක :- 111/163/8/28/එල්/එල්/11
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
**1993 පෙබරවාරි මස 25 වෙනි දින**

සියළුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්.

<u>රාමසන් සමයේදී විශේෂ නිවාඩු ලබා දීම</u>

1992 මාර්තු මස 11 වැනි දින අංක. 14/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට ඔබගේ අවධානය යොමු කරවමි.

02. 1993 වර්ෂයේ රාම්ලාන් (රාමසාන්) උත්සව සමයේදී මුස්ලිම් භක්තික රාජ්‍ය නිලධාරීන්ට / සේවකයින්ට යාඥ සහ ආගමික වතාවත්වල නිරත විය හැකි වන පරිදි වැඩපිලිවෙලක් සකස් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

03. ආගමික සහ යාඥ කටයුතු දිනපතා සිදු කෙරෙන වේලාවන් පහත දක්වෙන පරිදි වේ.

* පෙරවරු 3.00 සිට පෙරවරු 5.30 දක්වා
* පෙරවරු 6.00 සිට පෙරවරු 7.00 දක්වා
* පස්වරු 6.00 සිට පස්වරු 7.00 දක්වා
* පස්වරු 8.00 සිට රාත්‍රී 10.00 දක්වා

04. මෙම කාලසීමාවන් තුලදී ආගමික වතාවත්වල යෙදීමට හැකිවන පරිදි සැමවිටම වැඩ මුර සකස් කර දිය යුතුය. එහෙත් අත්‍යාවශ්‍ය අවස්ථාවලදී විශේෂ නිවාඩු අනුමත කිරීම මැනවි.

05. තවද 1993 රාම්ලාන් (රාමසාන්) අවසන් වීමේ දිනට දින 14 කට කලින් රාජ්‍ය. සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සුදුසුකම් ඇති මුස්ලිම් නිලධාරීන්ට / සේවකයින්ට උත්සව අත්තිකාරම් මුදල් ලබාදීමට ද කටයුතු කිරීම මැනවි.

අ/කලේ: එම්.එන්. ජුනයිඩ්.
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය